# නාට්‍ය හා රංගකලාව

අ.පො.ස (සාමාන්‍ය පෙළ ) සිසුන් ඉලකක් කරගත්

## විභාග ආකෘතියට සැකසු පෙරහුරු පරීක්ෂණ නිබන්ධනය

සමග

## ස්වයං අධ්‍යයනයට උචිත ලෙස සැකසු සවිස්තරාත්මක කරුණු සහිත පිළිතුරු පත්‍රය




අධීක්ෂණය

නිමල් දිසානායක මයා - (දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යකෂ)

එච්. එම්.චන්ද්‍ර කුමාර මයා - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යකෂ (සෞන්දර්ය) මාතර කලාපය

නිබන්ධන සැක්සුම

පී.එච්. නදීල් ශ්‍යාමන් - නාට්‍ය හා රංගකලාව ආචාර්ය (ශාරිපුත්‍ර විද්‍යාලය - මාතර)

සමපත් දායක - දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව



දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

| |
|---|
| දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>මාතර අධ්‍යාපන කලාපය |
| **SOUTHERN PROVINCE – DEPARTMENT OF EDUCATION**<br>**ZONAL EDUCATION OFFICE – MATHARA** |
| අධීක්ෂණය<br>නිමල් දිසානායක මයා - (දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ)<br>එච්. එම්.චන්ද්‍ර කුමාර මයා - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය) මාතර කලාපය |
| නිබන්ධන සැකසුම<br>පී.එච්. නදීල් ශ්‍යාමන් - නාට්‍ය හා රංගකලාව ආචාර්ය (ශාරිපුත්‍ර විද්‍යාලය - මාතර)<br>සම්පත් ආයක - දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

| | | |
|---|---|---|
| නාට්‍ය හා රංගකලාව<br>Drama And Theatre | 11 ශ්‍රේණිය<br>Grade 11 | කාලය පැය 03<br>Time 3 Hr |

## නාට්‍ය හා රංගකලාව I

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

- **පහත ගද්‍ය හා පද්‍ය ඇසුරෙන් 01 සිට 05 දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A. වනේ ගොසින් අපි නයි අල්ලන්නේ
විනේ යෙදෙයි දවසක ඇන ගන්නේ
අනේ කවු ද මේ ගතුව කියන්නේ
දණේ කාපි මගේ නයා බොලන්නේ

B. ඇන්නැවේ මේ මල කෝලම්
පාරෙ යන්නට බැ මුන් දූ සමගින්
මව්පියො නිදහස් වෙන්න සිතා බැඳ
දුන්නේය මා මේ අඟුටුමිටිය ටා

C. ගම්බිර කාලිංග නුවර නිරිඳුගෙ වාසල පුරයට
ඉන්න දනා සේම රජුට සෝදා පට පිළි සොඳට
ඉන් නරනා තැබු නම මට පේඩි විදානේ සත්තට
මං මෙතනට ආමි වියන් බඳිනට නරනිඳු එනවිට

D. යස ඉසුරු පිරුණු තැනා
සිරි දෙව් දූ සිටින තැනා
ළඟම ඇතේ දුරක නැතේ
අපි යන්නේ ඒ පාරේ

E. තෙමලා රෙද්ද නැලියේ ඔබට කොට
රවාලා පැනපි මහ ඉනිකුණා ගෙට
අඩාලා පැනපි කොල්ලෝ දොර පිලට
කපාලා දෙමුව තොටඹේ වීරයට

01. නූතන නාට්‍ය වලට අයත් කවි/ගීත අඩංගු වනුයේ,
1) A හා B ය 2) B හා D ය 3) C හා D ය 4) Bහා E ය

02. උඩරට සම්ප්‍රදායේ යාතුකර්මයකට අයත් කවි/ගීත ඇතුළත් වනුයේ,

1) A හා C ය　2) B හා E ය　3) A හා E ය　4) C හා D ය

03. පහතරට ප්‍රදේශ වල ජනප්‍රිය ගැමි නාටකයට අයත් කවි/ගීත ඇතුළත් වනුයේ,

1) B ය　2) C ය　3) D ය　4) E ය

04. ලූෂන් බුලත්සිංහලයන්ගේ වේදිකා නාට්‍යයක ඇතුළත් ගීත ඛණ්ඩය වනුයේ,

1) A ය　2) B ය　3) C ය　4) D ය

05. වෙස් මුහුණු භාවිතා කරමින් සිදුකරන රංගනයක් සහිත කවි/ගීත ඛණ්ඩය වනුයේ,

1) A ය　2) C ය　3) D ය　4) E ය

06. නෘත්ත සඳහා උදාහරණයක් වන්නේ,

1) ශිව පාර්වතී නර්තනය
2) කරදිය මුද්‍රා නාට්‍ය
3) තෙල්මෙ නර්තනය
4) කතකලි නර්තනය

07. නාට්‍ය ගුරුවරයා සිසුන්ට දෙහි, ලුණු සහ සීනි යන ද්‍රව්‍ය රස බැලීමට ලබා දීම මගින් සිදු කල රංග අභ්‍යාසය වන්නේ,

1) කටහඬ අභ්‍යාසය
2) ශ්වසන අභ්‍යාසය
3) චිත්ත ඒකාග්‍රතා අභ්‍යාසය
4) සංවේදන අභ්‍යාසය

08. කතාන්දරය හා නාට්‍ය අතර වෙනස හඟවනු ලබන්නේ,

1) කතාන්දරය ද නාට්‍ය ද කියවා රස විඳිය හැක.
2) කතාන්දරයක ගැටුම් අවස්ථා නොමැති අතර නාට්‍යයකද ගැටුම් අවස්ථා නැත.
3) කතාන්දරයක හා නාට්‍යයක සිද්ධි මාලාවක් ඇත.
4) කතාන්දරයක සිදුවීම් අනුපිළිවෙලින් සිදු වුව ද නාට්‍යයක සිදුවීම් වල අනුපිළිවෙලක් නැත.

09. රංග භූමියේ පිටුපසින් ඇති විශාල තිරය හඳුන්වන්නේ කුමන නමකින්ද?

1) ගඟනිකාව　2) පැති තිරය　3) පිටුපස තිරය　4) ප්‍රධාන තිරය

10. නාට්‍ය සංගීතය,

1) නාට්‍යයේ හිස්තැන් පිරවීමට අවශ්‍ය වේ.
2) ප්‍රේක්ෂකයා පිනවීමට අවශ්‍ය වේ.
3) නාට්‍යයේ භාවයන් උද්දීපනයට අවශ්‍ය වේ
4) ප්‍රේක්ෂකයාගේ අලස බව දුරු කිරීමට අවශ්‍ය වේ.

11. නාට්‍ය පෙළ රංගනයක් බවට පත් කිරීමේ දී පුරෝගාමී වන්නේ,

1) අනුෂාංගික ශිල්පීන්ගේ කාර්යය භාරයයි
2) නිෂ්පාදකයාගේ කාර්යය භාර්යයි
3) අධ්‍යක්ෂකගේ කාර්යය භාරයයි
4) වේදිකා පාලකගේ කාර්යය භාරයයි

12. වේෂභූෂණ ශිල්පියාගේ වගකීම,

1) රංග රචනය ප්‍රබල කිරීමට දායක වීමයි.
2) අඩු වියදම මත අධ්‍යක්ෂකවරයාට දායක වීමයි.
3) චිත්තාකර්ෂණීය ලෙස ප්‍රේක්ෂකයා බැඳ ගැනීමට දායක වීමයි.
4) වේදිකා මායාව ප්‍රබල කිරීමට දායක වීමයි.

13. නළු නිළියන් සමූහයක්, දෙදෙනෙක් හෝ තනි අයෙක් වුවද වේදිකා අවකාශය තුළ අපූර්ව ලෙස චලනය කරවන ආකාරය,

1) වේදිකා පරිපාලනයයි　2) රංග වින්‍යාසයයි　3) රූපණයයි　4) නර්තනයයි

14. පින්තූර රාමු වේදිකාව මනඃකල්පිත ලෙස බොහෝ විට බෙදා දක්වනු ලබන්නේ,
    1) කොටස් හතරකටය
    2) කොටස් හයකටය
    3) කොටස් නවයකටය
    4) කොටස් දොළහකටය

15. අභිරූපණ රංගනයක් සඳහා,
    1) ඕනෑම සිදු වීමක් යොදා ගත හැකිය.
    2) ඕනෑම අවස්ථාවක් යොදා ගත හැකිය.
    3) වාචික අභිනය ද යොදා ගත හැකිය.
    4) නරඹන්නාට මවාගත හැකි සිදු වීමක් නිරූපණය කළ යුතුය.

- **පහත දක්වෙන වගුව ඇසුරෙන් අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| මුල් කෘතිය | මුල් රචකයාගේ නම | අනුවර්තන කෘතිය | අනුවර්තක |
|---|---|---|---|
| ද කැම්ප්බෙල් ඔෆ් ක්ලිමර් | ක | රත්තරං පුතා | සෝමපාල ගුණධීර |
| ග | කැරල් චැපෙන් සහෝදරයෝ | බෝසතාණෙනි | බන්දුල ජයවර්ධන |
| ද බූර්ෂුවා ජෙන්ටිල්ඩම් | මොලියර් | ජ | බන්දුල ජයවර්ධන |
| ද හවුස් ඔෆ් ද ඔගස්ට් මූන් | වර්න්ස් හයිඩර් | ඇසල සඳ අවන්හල | ය |
| ද රෙස්පෙක්ටබල් ප්‍රොස්ටිටියුට් | ෂෝන් පෝල් සාත්‍රෙ | ඩ | උදය මල්ලවාරච්චි |

16. ඉහත වගුවේ "ක" කොටුවට ඇතුළත් විය යුතු රචකයාගේ නම කුමක්ද?
    1) ජ් ෆර්ගියුසන් 2) ලුයිජි පිරැන්ඩෙලෝ 3) ඇන්ටන් චෙකොව් 4) රේ කුනී

17. ඉහත වගුවේ "ග" කොටුවට ඇතුළත් විය යුතු මුල් කෘතිය කුමක්ද?
    1) ද මැරේජ් 2) කෘමි නාටක 3) ඉක් නෙවිටායි 4) යෙර්මා

18. ඉහත වගුවේ "ජ" කොටුවට ඇතුළත් විය යුතු අනුවර්තන කෘතිය කුමක්ද?
    1) මොනර පිල් 2) වෙස් මුහුණු 3) මඟුල් ප්‍රස්තාව 4) මූදූ පුත්තු

19. ඉහත වගුවේ "ට" කොටුවට ඇතුළත් විය යුතු අනුවර්තකයා කවුරුන් ද?
    1) සෝමපාල ගුණධීර 2) උදය මල්ලවආරච්චි 3) බන්දුල ජයවර්ධන 4) සුගතපාල ද සිල්වා

20. ඉහත වගුවේ "ඩ" කොටුවට ඇතුළත් විය යුතු අනුවර්තන කෘතිය කුමක්ද?
    1) මහ ගෙදර 2) නම්බුකාර අභිසරුලය 3) හිත හොඳ අම්මණ්ඩි 4) අහස් මාලිගා

- **පහත ඡායාරූප ඇසුරු කර ගනිමින් 21 සිට 25 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



ක ග ජ ට ඩ

21. මහාචාර්ය නෝබට් ජේ මයර් නම් විදේශික නාට්‍ය කරුවාගේ වැඩ මුළුවට සහභාගී වීමෙන් රංගනයට පිවිසි නාට්‍ය ශිල්පියා/ශිල්පිනිය වනුයේ,
    1) ග ය 2) ජ ය 3) ඩ ය 4) ක ය

22. ලංකාවේ ජන නාට්‍ය සම්ප්‍රදාය, ශාන්තිකර්ම ආදිය පිළිබඳව පර්යේෂණ සිදු කල නාට්‍ය ශිල්පියා/ශිල්පිනිය වනුයේ,

1) ට ය 2) ග ය 3) ක ය 4) ඩ ය

23. ශ්‍රී ලංකාවේ ළමා නාට්‍ය කලාව උදෙසා අනුපමේය මෙහෙයක් සිදු කල නාට්‍ය ශිල්පියා/ශිල්පිනිය දක්වෙන ඡායාරූපය වනුයේ,

1) ග ය 2) ක ය 3) ජ ය 4) ඩ ය

24. වේදිකා නාට්‍ය හා චිත්‍රපට රංගනය සහ ස්වතන්ත්‍ර, අනුවර්තන, පරිවර්තන නාට්‍ය කෘති රැසක් රචනය හා අධ්‍යක්‍ෂණය කල නාට්‍ය ශිල්පියා/ශිල්පිනිය දක්වෙන ඡායාරූපය වනුයේ,

1) ජ ය 2) ක ය 3) ඩ ය 4) ග ය

25. "ග" ඡායාරූපයෙන් දක්වෙන නාට්‍ය කරුගේ නිර්මාණ පමණක් දක්වෙනුයේ,

1) ගජමන් පුවත, තලමල පිපිලා, ගුරු තරුව, කැළණි පාලම
2) පුත්‍ර සමාගම, මහගිරිදඹ, ගුරු තරුව, අන්දරේලා
3) රතු හැට්ටකාරී, ලෝකය තනි යායක්, ගුරු තරුව, මායාදේවී
4) රෝමය ගිනි ගනී, පුත්‍ර සමාගම, ගජමන් පුවත, අහසින් වැටුණු මිනිස්සු

- **26 සිට 35 දක්වා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරන්න.**

26. ශෝකජනක අවස්ථාවක් නිරූපණය කිරීම සඳහා යොදා ගනු ලබනුයේ,

1) දුක්බර සංගීතය හා නෙත් කොනින් බැලීම
2) ඇසේ කඳුළු සහ ලයාන්විත ව ගලා යන සංගීතය
3) දුක්බර භාව හා ශෝක සංගීතය
4) නුරා බැලුම් හා නෙත් කොනින් බැලීම

27. දකුණුපස ඡායාරූපයෙන් දක්වෙනුයේ,



1) නාට්‍යමය ජවනිකාවකි
2) නෘත්ත අවස්ථාවකි
3) නෘත්‍ය අවස්ථාවකි
4) මුද්‍ර නාට්‍ය අවස්ථාවකි

28. නාට්‍යයක රූපණයේ යෙදෙන නළුවාට රූපණය සාර්ථක කර ගැනීම සඳහා වැදගත් වන රංග අභ්‍යාසය වනුයේ,

1) කටහඬ අභ්‍යාසය 2) ශ්වසන අභ්‍යාසය
3) පරිකල්පන අභ්‍යාසය 4) ඉහත සඳහන් සියල්ලම


29. රංගිරි කුළයක ඇති වූ දුමාරයකින් උපන් බිසව්වරු පිළිබඳව පුරාවෘත්ත කථාවක් ඇතුළත් යාතුකර්මයක් වනුයේ,

1) දහඅට සන්නිය 2) රට යැකුම 3) සූනියම් යාගය 4) ගම්මඩු/දෙවොල්මඩු

30. දේව දූතයකු ලෙස කුඩා පිරිමි ළමයකු වස්ත්‍ර හා ආභරණ වලින් සරසා සිදු කරනු ලබන පූජා කර්මය වනුයේ,

1) ආලවක දමනයයි 2) මිලින්ද ප්‍රශ්නයයි
3) දොරකඩ අස්න කීමයි 4) යුගාසන ධර්ම දේශනයයි

31. දකුණුපස ඡායාරූපයේ දක්වෙන ශිල්පියා වනුයේ,



1) ප්‍රේමසිරි කේමදාස
2) එදිරිවීර සරච්චන්ද්‍ර
3) ලෙස්ටර් ජේම්ස් පීරිස්
4) මාර්ටින් වික්‍රමසිංහ


32. පරයා, ආඩිගුරු, සොත්තානා යන චරිත ඇතුළත් ජන නාටකය වනුයේ,
1) සොකරි 2) කෝලම් 3) පාස්කු 4) නාඩගම්



33. ශ්‍රී ලංකාවේ නූර්ති නාට්‍ය බිහි වීමේ දී මුල්ම සිංහල නූර්තිය නිර්මාණය කරන ලද්දේ,
1) ජෝද සිල්වා විසිනි 2) චාලස් ඩයස් විසිනි
3) සී දොන්බස්තියන් විසිනි 4) පිලිප්පු සිඤ්ඤො විසිනි

34. නොගැලපෙන සම්බන්ධතාවය ඇතුළත් පිළිතුර තෝරන්න.
1) හෙළ ගැඹුරුයි පුත නොබලන් - හුණු වටයේ කතාව නාටකය
2) බෝමා ජාති ඇති බෝවී - තාරාවෝ ඉගිලෙති නාටකය
3) ලප නොමවන් සඳසේ සොමි ගුණෙනා - මනමේ නාටකය
4) අම්බරයේ සඳ සේ දිලී - දික්තල කාලගෝල නාටකය

35. නාට්‍ය නිර්මාණයක ඉදිරි පැවැත්ම රඳා පැවතීමට බලපාන ප්‍රධාන සාධකයක් වනුයේ,
1) නාට්‍යයේ කථා වස්තුවයි 2) නාට්‍ය අධ්‍යක්ෂවරයාගේ ජනප්‍රියත්වයයි
3) ප්‍රේක්ෂකයාගේ ප්‍රතිචාරයයි 4) නාට්‍යය ප්‍රවේශ පත්‍රයේ මිලයි

- **36 සිට 40 දක්වා ඇති ප්‍රශ්න වලට පහත රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**



ක ග ජ ට

36. උඩරට ප්‍රදේශ වල ජනප්‍රිය ගැමි නාටකය රඟ දක්වන ලද රංග භූමියට අදාළ ඡායාරූප වන්නේ කුමක්ද?
1) ක ය 2) ග ය 3) ජ ය 4) ට ය

37. "ග" හි දැක්වෙන වේදිකාවේ රඟ දක්වන නාට්‍ය වර්ගය වනුයේ,
1) සොකරි 2) කෝලම් 3) නාඩගම් 4) නූර්ති

38. උත්තර භාරතීය සංගීතයේ ආභාෂය ඇතිව ලංකාවේ රඟ දක්වන ලද නාට්‍ය සඳහා අදාළ වේදිකාව අයත් පින්තූරය වනුයේ,1)ක ය 2) ග ය 3) ජ ය 4) ට ය

39. තෙරුක්කූත්තු නම් රංග සම්ප්‍රදායක ආභාෂය ඇතිව ලංකාවේ ස්ථාපිත වූ නාට්‍ය රඟ දක්වන ලද වේදිකාව වනුයේ,
1) ක ය 2) ග ය 3) ජ ය 4) ට ය

40. වෙස් මුහුණු භාවිතා කරමින් කරනු ලබන නාට්‍ය සම්ප්‍රදාය රඟ දක්වන වේදිකා වන්නේ,
1) ක සහ ග 2) ග සහ ජ 3) ජ සහ ට 4) ක සහ ජ

***

| දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>මාතර අධ්‍යාපන කලාපය |
|---|
| **SOUTHERN PROVINCE – DEPARTMENT OF EDUCATION**<br>**ZONAL EDUCATION OFFICE – MATHARA** |
| අධීක්ෂණය<br>නිමල් දිසානායක මයා - (දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ)<br>එච්. එම්.චන්ද්‍ර කුමාර මයා - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය) මාතර කලාපය |
| නිබන්ධන සැකසුම<br>පී.එච්. නදිල් ශ්‍යාමන් - නාට්‍ය හා රංගකලාව ආචාර්ය (ශාරිපුත්‍ර විද්‍යාලය - මාතර)<br>සම්පත් දායක - දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

| නාට්‍ය හා රංගකලාව<br>Drama And Theatre | 11 ශ්‍රේණිය<br>Grade 11 | කාලය පැය 03<br>Time 3 Hr |
|---|---|---|

## නාට්‍ය හා රංගකලාව II

➤ **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (5) පිළිතුරු සැපයිය යුතුය.**

(01) පහත දී ඇති සංවාද ඛණ්ඩය ඇසුරු කර ගනිමින් අසා ඇති ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න.

A - අන්න හරි ස්වාමිනි. මොහුට නිසි දඩුවම් දෙන්න.
B - නිශ්ශබ් ද වී මෙහෙගේ පිලි වදනට ඉඩ දෙනු
C - මාගේ අතින් වුන වරදට සමාව වනු ස්වාමිනී. මැගේ දුක්මුසු මුහුණ දුටු විට මට ඇය රැගෙන යාමට ද සිත් විය. ඇය ද මා සමඟ ආවේ සිය කැමැත්තෙන්මය....

i. ඉහත සංවාද භාවිතා කරන A සහ B චරිත නම් කරන්න. (ලකුණු 2)
ii. ඉහත සංවාද ඇතුළත් නාටකය නම් කරන්න. (ලකුණු 2)
iii. එම නාටකයේ මුල් අධ්‍යක්ෂක හා පෙළ රචක නම් කරන්න. (ලකුණු 2)
iv. එම නාටකයේ සංගීතය සඳහා භාවිතා කර ඇති ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය කුමක්ද? (ලකුණු 2)
v. එම නාටකය අවසානයේ පොතේගුරු හා ගායක පිරිස ගායනා කරන ගීතය හදුන්වන්නේ කෙසේද? (ලකුණු 2)
vi. එම නාටකයෙන් ලබා දෙන දෘෂ්ටිය කෙටියෙන් දක්වන්න. (ලකුණු 2)

(02) i. කංකාරියක් යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)
ii. කොහොඹායක් කංකාරිය පැවැත්වීමේ මුඛ්‍ය අරමුණ පෙන්වා දෙන්න. (ලකුණු 4)
iii. කොහොඹායක් කංකාරියේ අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ ඇතුළත් නාට්‍යමය පෙලපාලි පිළිබඳ කෙටි විමසීමක් කරන්න. (ලකුණු 6)

(03) i. වේදිකා නළුවකුට රංග අභ්‍යාස අවශ්‍ය ඇයි ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 2)
ii. ඔබ දන්නා ශාරීරික හා මානසික රංග අභ්‍යාස 01 බැගින් ලියන්න. (ලකුණු 4)
iii. රංග අභ්‍යාස තුළින් නළුවාට ලැබෙන ප්‍රයෝජන සඳහන් කරන්න. (ලකුණු 6)

(04) i. වේෂභූෂණ යන්න හදුන්වන්න. (ලකුණු 2)
ii. නාට්‍යයකට වේෂභූෂණ නිර්මාණයේ දී සැලකිල්ලට ගනු ලබන කරුණු 4 ක් දක්වන්න. (ලකුණු 4)
iii. අංග රචනය කිරීමේදී අංග රචනා ශිල්පියාගේ අවධානයට ලක් විය යුතු කරුණු මොනවාද? (ලකුණු 6)

(05) පහත ඡායාරූපය හඳුනාගෙන අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



i. ඉහත ඡායාරූපයේ දැක්වෙන රංගන ශිල්පිනිය නම් කරන්න. (ලකුණු 2)

ii. එම රංගන ශිල්පිනිය රංගනයෙන් දායක වූ නාට්‍ය 4 ක් සඳහන් කරන්න. (ලකුණු 4)

iii. ඉහත ඡායාරූපයේ දැක්වෙන නාට්‍ය නිර්මාණයේ අධ්‍යක්ෂකවරයා නම් කර ඔහුගේ ස්වතන්ත්‍ර සහ පරිවර්තන නාට්‍ය 03 බැගින් සඳහන් කරන්න. (ලකුණු 6)

(06) i. නළුවරණය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2)

ii. නාට්‍යයක රූපණය යන්න කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 4)

iii. නාට්‍ය පිටපතක් රංගනයක් බවට පත් කිරීමේ දී අධ්‍යක්ෂකවරයාගේ කාර්ය භාර්යය පැහැදිලි කරන්න. (ලකුණු 6)

(07) පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කරගෙන නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කර ගත හැකි ය.

ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වී සුනිමල් ගමක සිට නගරයේ ජනප්‍රිය පාසලකට යන දක්ෂ ළමයෙකි. සමස්ථ ලංකා පාසල් අතර පවතින නාට්‍ය තරඟය සඳහා නිර්මාණය කරන නාට්‍යයට සිසුන් තෝරා ගැනීමේ දී පාසලට නවකයකු වූ සුනිමල් ද ඊට ඉදිරිපත් විය. ඔහුගේ දක්ෂකම දුටු නාට්‍ය ගුරුවරයා එහි ප්‍රධාන චරිතය ට සුනිමල් තෝරා ගනී...

i. පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමඟ සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 4)

ii. චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ලකුණු 4)

iii. දෙගිඩියාව, කුතුහලය, උත්ප්‍රාසය සහිත නාට්‍යෝචිත අවස්ථාවන් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 4)

***

## පිළිතුරු පත්‍රය

### නාට්‍ය හා රංගකලාව - I

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1) | 2 | 11) | 3 | 21) | 3 | 31) | 1 |
| 2) | 3 | 12) | 4 | 22) | 1 | 32) | 1 |
| 3) | 2 | 13) | 2 | 23) | 3 | 33) | 3 |
| 4) | 4 | 14) | 3 | 24) | 2 | 34) | 2 |
| 5) | 2 | 15) | 4 | 25) | 2 | 35) | 3 |
| 6) | 3 | 16) | 1 | 26) | 3 | 36) | 1 |
| 7) | 4 | 17) | 2 | 27) | 3 | 37) | 2 |
| 8) | 4 | 18) | 1 | 28) | 4 | 38) | 4 |
| 9) | 1 | 19) | 4 | 29) | 2 | 39) | 3 |
| 10) | 3 | 20) | 2 | 30) | 3 | 40) | 1 |

### නාට්‍ය හා රංගකලාව - II

(01) i. A - කාලගෝල / B - මහෞෂධ පඬිතුමන්
ii. දික්තල කාලගෝල නාටකය
iii. චාල්ස් ද සිල්වා ගුරුන්නාන්සේ
iv. මද්දලය
v. මංගලම් ගීතය
vi. ස්ත්‍රියකගේ ආදරය බලහත්කාරයෙන් හෝ නීති මඟින් ලබා ගත නොහැකි බව

(02) i. ලංකාවේ උඩරට ශාන්තිකර්ම සම්ප්‍රදායේ එන ප්‍රධානතම යාතුකර්මය වනුයේ කොහොඹා කංකාරියයි. ඒ අනුව කංකාරිය යනු වසරේ නිශ්චිත වූ කාලයක් තුළ දෙවියන් සතුටු කරවීම සශ්‍රීකත්වය හා සෞභාග්‍යය අපේක්ෂාවෙන් සිදු කරන සශ්‍රීකවර්ධන යාතුකර්මයක් වේ. කොහොඹා දෙවියන් ප්‍රධාන අවශේෂ ගම්භාර දෙවිවරුන් පුද ලබමින් වසරේ නිශ්චිත කාලයක් තුළ ගමේ සියලු දෙනාගේම සහභාගීත්වයෙන් හා දායකත්වයෙන් පවත්වනු ලබන යාතුකර්මය කංකාරිය ලෙස හඳුන්වයි. දෙවියන්ගේ ආශිර්වාදය හා ආරක්ෂාව අපේක්ෂාවෙන් පවත්වනු ලබන උළෙල යන අර්ථය කංකාරිය නමින් හැඳින්වේ.

ii.
- ධන ධාන්‍ය, ගවමහේෂාදීන් ආදී හා භවභෝග සම්පත් වැඩි දියුණු කර ගැනීම.
- ගමකට, රටකට හෝ ප්‍රදේශයකට පැමිණ ඇති ව්‍යසනයන්ගෙන් මිදී සෙත් ශාන්තිය ලබා ගැනීමට.
- පුද්ගලයෙකු කෙරෙහි බලපා ඇති යම් රෝගාබාධ සුවකර ගැනීමට.
- පොදුවේ වැළඳෙන පැපොල, සරම්ප වැනි දෙයියන්ගේ ලෙඩ ආදියෙන් ආරක්ෂා වීමට.

iii. කොහොඹා කංකාරියෙහි එන බොහෝ නාට්‍යමය පෙළපාලි වල නාට්‍යමය ලක්ෂණයන් මනාව විද්‍යාමාන කරයි. එහි එන එක් නාට්‍යමය පෙළපාලියක් ලෙස ඌරා යක්කම හැඳින්විය හැකිය. කංකාරිය පුරාවෘතයට අනුව එදා පඬුවස්දෙව් රජුට දිවි දෝෂය දුරු කිරීම සඳහා රාහු අසුරේන්ද්‍රයා ඌරු වෙස් ගෙන මලය රජු ලක්දිවට ගෙන්වා ගත් අවස්ථාව වර්තමානයට නැගීමක් ලෙස කංකාරියේ ඌරා යක්කම දැක්විය හැකිය. එමෙන්ම ගොවීන්ගේ අටු කොටු සඳහා හානි කරන ප්‍රධාන සත්ත්වයකු ලෙස ඌරා ගත හැකි අතර එවැනි සතකු අල්ලා ඊට සහභාගී වූවන් අතර ඌරාගේ කොටස් බෙදා ගන්නා ආකාරය මෙයින් නිරූපණය වේ.

ගුරුගේ මාලාව කංකාරියේ දක්නට ලැබෙන තවත් නාට්‍යමය අවස්ථාවකි. එහිදී නල්ලසාදි ගුරු නම් තැනැත්තෙකු බත් ඇතුළු කන බොන දෑ වලින් සමන්විත තටුවකින් පුද ලබනු ලැබේ. මෙය වූ කලී හාස්‍යමය ලක්ෂණයන්ගෙන් යුත් නාට්‍යමය පෙළපාලියකි. මන්ද මෙහි සංවාද භාවිතයේදී ඇතිවනු ලබන්නා වූ භාෂාමය අර්බුධය නිසාය. නල්ලසාදි ගුරු ඉන්දියාවේ ආන්ද්‍ර ප්‍රදේශයේ සිට පැමිණෙන නිසා ඔහුට සිංහල නොතේරේ. එම නිසා බෙර කරුවන් සමඟ සංවාද භාවිතයේදී හාස්‍ය රසය මතුවේ.

එමෙන්ම කොහොඹා කංකාරියේ එන තවත් නාට්‍යමය පෙළපාලියක් ලෙස නයා යක්කම හැඳින්විය හැකිය. සෝලිය ගුරු නැමැත්තෙකුට දානයක් දීමට යන අතරතුර නයකු දෂ්ඨ කිරීම සමග බැඳුනු කතා අවස්ථාවක් එහිදී ඉදිරිපත් කෙරේ. මෙහි සෝලිය ගුරු යනු පන්සලේ හාමුදුරුවන් බවද සමහරුන්ගෙ මතයයි. නාට්‍යමය පෙළපාලිය ආරම්භ වනුයේ ප්‍රධාන යක් දෙස්සා සුදු සලුවක් රැගෙන කවි ගායනා භාවිතා කරමින් යාග මණ්ඩපය වටා පරික්‍රමණය කර සම්මාදමේ යෙදෙන ආකාරය නිරූපණය කරමින්ය.

පමා නැතුව සම්මාදන් දෙනුය අනේ
සෝලිය ගුරුට දානෙට මොනවත් දෙනුය අනේ

ඉන්පසු සම්මාදන් කරගෙන ආ වී කෙටීම, වී පෙලීම ආදිය අවස්ථාවක් අනුකරණාත්මකව ඉදිරිපත් කරයි. ඊට අනුරූපව ගැටබෙරය හා තාලම්පට වාදනය කරනු ලබයි. නයා යක්කමේ සංවාද භාවිතය ද හාස්‍යමය විලාශයක් ගනී. පහත දැක්වෙනුයේ වී මනින අවස්ථාවේ භාවිතා වන සංවාද ඛණ්ඩයකි.

ගුරුන්නාන්සේ :- ඔව් මනිනව බලන්න
යක්දෙස්සා :- අටයි
ගුරුන්නාන්සේ :- ලාභ ගහනකොටම ?
යක්දෙස්සා :- (වී මනිමින්) දහපහයි
ගුරුන්නාන්සේ :- දහපහයි? පුදුම ගනංකාරයෙක්නේ හොඳ ගනං එව්ව.
යක්දෙස්සා :- විසිදොළහයි
ගුරුන්නාන්සේ :- අම්මට සිරි

නයා යක්කමේ සංවාද තුළ ලිංගිකත්වය පිළිබඳව ද සඳහන් කරයි. මන්ද අතීත ගැමියන් ලිංගිකත්වය සශ්‍රීකත්ව ලක්ෂණයක් ලෙස සැලකූහ. වර්තමාන නාට්‍යමය අර්ථයෙන් ගත් කළ අනුකරණය, සමාරෝපය, සංවාද භාවිතය, සතර අභිනය, රංග භාණ්ඩ භාවිතය, කවි ගායනා භාවිතය ආදී නාට්‍යමය ලක්ෂණයන් නයා යක්කම් ජවනිකාව තුළ විද්‍යාමාන වනු ලබයි.

(03) i. වේදිකා නාට්‍යයක ඇති දෘශ්‍ය ස්වභාවය ප්‍රේක්ෂකයා දකිනුයේ නළු නිළියන් තුළිනි. එහිදී නළුවාගේ සිරුර සහ කටහඬ කේන්ද්‍ර කර ගනිමින් ප්‍රේක්ෂකයා ඉදිරියේ රූපණ කාර්යය සිදු කළ යුතුය. ඊට රංගන ශිල්පියාට තම සිරුර මනාව හැසිරවීමට හා පාලනය කිරීමට සිදුවේ. ඒ සඳහා රංගන ශිල්පියාට නිරන්තර රංග අභ්‍යාස වල නිරත වීමට අවශ්‍යය. ශරීර චලනයන් පාලනය කිරීමට සබකෝලය දුරු කර ගැනීමට, රංගෝචිත කටහඬක් ලබා ගැනීමට, මානසික සහ ශාරීරික ඒකාග්‍රතාවය ඇති කර ගැනීමට ආදිය තුළින් සාර්ථක රංගනයක් සිදු කිරීම සඳහා නළුවාට රංග අභ්‍යාස වැදගත් වේ.

ii. නළුවකුට ශාරීරික ප්‍රකාශනය සඳහා බාහිර ශරීරය වෙනුවෙන් සිදුකරන රංග අභ්‍යාස ශාරීරික අභ්‍යාසයන්ය. එනම්,

- නම්‍යශීලී අභ්‍යාස
- දර්පණ අභ්‍යාස
- කටහඬ අභ්‍යාස
- සංවේදන අභ්‍යාස

ආදිය ශාරීරික අභ්‍යාසයන්ය. නළුවාට ශරීරයේ ශාරීරික හා මානසික සමබරතාවය ශාරීරික නිරෝගීභාවයද පවත්වා ගෙන යෑම සඳහා ශාරීරික අභ්‍යාස වැදගත් වේ. වේදිකාව මත විවිධ චරිත නිරූපනයේදී නම්‍යශීලී මෙන්ම මනාව හැසිරවිය හැකි ශරීරයක් පවත්වා ගැනීමට චරිතයට උචිත පරිදි කටහඬ මතුකර දැක්වීම සඳහා කටහඬ අභ්‍යාසයන් ඉතා වැදගත්ය.

එමෙන්ම නළුවාට මානසික ඒකාග්‍රතාවය හා සමබරතාවය ලබා ගැනීම සඳහා මානසික අභ්‍යාස වැදගත්වේ. ඒවා ශිථිලීකරණ අභ්‍යාස නමින් හඳුන්වයි. මේ සඳහා හිමකන්ද දියවීම, දැල්වෙන ඉටිපන්දම දෙස බලා සිටීම ආදී අභ්‍යාස ක්‍රමවේද අනුගමනය කළ හැකි වේ. එමෙන්ම චිත්ත ඒකාග්‍රතාවය ඇති කර ගැනීම තුළින් නළුවාට මානසික වශයෙන් තමන් නිරූපිත චරිතය පුරා නොකඩවා ජීවත් වීමට හැකියාව ලැබේ. නාට්‍යයේ සංවාද ආදිය මතක තබා ගැනීමටද විවිධාකාර වූ ප්‍රේක්ෂක ප්‍රතිචාර හමුවේ නොසැලී සිය චරිතය තුළ රැඳී සිටීමට අභ්‍යන්තර සමාරෝපය කෙරෙහිද මෙම අභ්‍යාස බලපානු ලැබේ.

iii.
- නම්‍යශීලී සහ නිරෝගී සහ මනාව හසුරුවා ගත හැකි සිරුරක් පවත්වා ගත හැකි වීම.
- කායික සහ මානසික සැහැල්ලුවෙන් යුක්තව චරිත ප්‍රවේශ වීම හා චරිතයේ ජීවත් වීමට හැකිවීම.
- වේදිකාවට උචිත පරිදි රංගෝචිත කටහඬක් ලබා ගත හැකි වීම.
- නළුවාගේ පරිකල්පන ශක්තිය දියුණු කර ගත හැකි වීම.
- ශිල්පියාට සමබර පෞරුෂයක් ඇති කර ගත හැකි වීම.
- රූපණයේදී සංවාද ආදිය මතක තබා ගැනීමට අවශ්‍ය මතක ශක්තිය වර්ධනය වීම.

(04) i. නාට්‍යයකදී චරිත නිරූපනය සඳහා නළු නිළියන් විසින් යොදා ගනු ලබන්නාවූ රංග වස්ත්‍ර, රංගාභරණ ආදිය වේෂ භූෂණ නම් වේ.

ii.
- නාට්‍යයේ රංග ශෛලියට අදාළ වීම.
- නාට්‍යයේ කතා වස්තුවේ නිරූපිත කාලය, දේශය, යුගය ආදියට ගැළපෙන පරිදි නිර්මාණය කිරීම.
- චරිතවල අභ්‍යන්තර මනෝභාවයන් සහ චරිත ලක්ෂණ කෙරෙහි සැලකිලිමත් වීම.
- යොදා ගනු ලැබිය යුතු වර්ණ සහ අමු ද්‍රව්‍ය කෙරෙහි සැලකිලිමත් වීම.
- නළුවාට පහසුවෙන් පරිහරණය කිරීමට හැකි පරිදි නිර්මාණය කිරීම.
- භාවිතයේදී රංගනයට බාධා නොවන පරිදි සකස් කිරීම.

iii.
- නාට්‍යයේ චරිතයේ ස්වභාවය හා වයස පිළිබඳව අවධානය යොමු කිරීම.
- චරිතයට අදාළ කාලය, දේශය, යුගය ආදියට ගැළපෙන පරිදි නිර්මාණය කිරීම.
- චරිතයේ බාහිර හා අභ්‍යන්තර ගති ලක්ෂණ
- නාට්‍යයේ රංග ශෛලිය
- නළුවාගේ මුහුණේ හැඩය
- යොදා ගනු ලබන ද්‍රව්‍ය හා උපකරණ

(05) i. මානෙල් ජයසේන මහත්මිය

ii. කුවේණි, ජනේලය, තවත් උදෑසනක්, අහස් මාළිගා හුනුවටයේ කතාව, අපට පුතේ මඟක් නැතේ, මනරංජන වැඩවර්ජන, දිරිය මව සහ ඇගේ දරුවෝ

iii. හෙන්රි ජයසේන මහතා

ස්වතන්ත්‍ර නාට්‍ය

| | | | |
|---|---|---|---|
| 1959 - | පව්කාරයෝ | 1965 | - මනරංජන වැඩවර්ජන |
| 1962 - | ජනේලය | 1968 | - අපට පුතේ මඟක් නැතේ |
| 1962 - | කුවේණි | 1975 | - සරණ සියොත් සේ පුතුනි හඹා යන |
| 1964 - | තවත් උදෑසනක් | | |

පරිවර්තන නාට්‍ය

1953 - මනාලයෝ (ෂෙරිඩන්ගේ ද රයිවල්ඞ්)
1954 - වැදගත්කම (ඔස්කාර් වයිල්ඩ් ගේ A Women of no importance)
1966 - අහස් මාළිගා (ටෙන්සි විලියම්ස්ගේ The glass menagery)
1967 - හුනුවටයේ කතාව (බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ගේ Coaisian chalk cercle)
1973 - මකරා (එව්ගිනි ඉෂ්වාන්ස්ගේ The Dragon)
1972 - දිරිය මව ඇගේ දරුවෝ (බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ Mother corrage)

(06) i. නාට්‍ය පිටපතක ඇතුළත් චරිත වේදිකාව මත ජීවමාන කිරීමට ගැළපෙන නළු නිළියන් තෝරා ගැනීම නළුවරණය නම් වේ.

ii. රූපණය යනු, රඟපෑමයි. නළුවෙකු විසින් නාට්‍ය පිටපතක දක්නට ඇති චරිතය වේදිකාව මත ජීවමාන කිරීමේ කාර්යය රූපණයයි. ලෝකයේ විවිධ නාට්‍යවේදීන් රූපණය සම්බන්ධයෙන් විවිධ මතවාද ඉදිරිපත් කර ඇත. ඒ අතර විශේෂයෙන් නළුවෙකු සාර්ථක රූපණයක් සඳහා නළුවාට බාහිර ප්‍රකාශනය සහ අභ්‍යන්තර ප්‍රකාශනය පිළිබඳව මනා අවබෝධයක් පැවතිය යුතුය. බාහිර ප්‍රකාශනය තුළින් චරිතයක බාහිර ගති ලක්ෂණ පිළිබඳවත්, අභ්‍යන්තර ප්‍රකාශනය තුළින් අභ්‍යන්තර ගති ලක්ෂණ පෙන්නුම් කරන අතර ඒ පිළිබඳව අවබෝධයක් ලබා ගනිමින් සාර්ථක රංගනයක් සිදුකළ හැකි වේ. ඒ අනුව නළුවකු තම පුද්ගලික චර්යාවන්ගෙන් මිදී අන්‍ය පුද්ගල චර්යාවන් දක්වමින් චරිත නිරූපනය කිරීම රූපණයේදී සිදුවේ.

iii.
- නාට්‍ය පිටපත අධ්‍යයනය කිරීම හා අවබෝධ කර ගැනීම.
- නිෂ්පාදන පිටපත සකස් කිරීම.
- සහාය අධ්‍යක්ෂකවරයා පත් කර ගැනීම.
- නළුවරණය සිදු කිරීම.

- අනුෂාංගික ශිල්පීන් තෝරා ගැනීම.
- නාට්‍ය පිටපත හඳුන්වා දීම හා පුහුණු වීම් ආරම්භ කිරීම.
- අනුෂාංගිත අංග සම්බන්ධ කිරීම.
- කාර්මික පුහුණුව (ආලෝක පුහුණුව)
- සවේශ පුහුණුව
- මංගල දර්ශනය

මීට අමතරව නාට්‍ය පිටපත ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලයෙන් අනුමත කර ගැනීමද මුහුරත් උළෙල පැවැත්වීමද මෙම ක්‍රියාවලිය තුළ ඇති අංගයන්ය.

(07) (වේදිකාව පසෙකින් රෝහලක ඇඳක් මත සුනිමල් ඉතාමත් අමාරුවෙන් කෑ ගසමින් සිටියි. ඔහුගේ දෑස්වල කඳුළුය. සිරුර ඉතාමත්ව වෙහෙසට පත් වී ඇති බවක් ඉරියව් වලින් පෙන්නුම් කෙරේ.)

නාට්‍ය ගුරුවරයා :- සුනිමල් පුතේ, දැන් ඔයාට කොහොමද? සනීපයි නේද ?

සුනිමල් :- මට නාට්‍ය තරඟයට යන්න බැරි වෙයිද සර් ?

නාට්‍ය ගුරුවරයා :- අපි ඉක්මණින් හොඳ වෙලා යමුකො

සුනිමල් :- තීක්ෂණටයි, නිර්මලාටයි කියන්න නාට්‍ය හොඳට පුහුණු වෙන්න කියලා. මොකද මං ආවම නාට්‍ය සම්පූර්ණයෙන්ම ඉවර කරන්න පුළුවන්නෙ.

(හයියෙන් සුනිමල් අඬන්නට විය.)

නාට්‍ය ගුරුවරයා :- ඔව් අපි තීක්ෂණටයි, නිර්මලාටයි නාට්‍ය පුහුණුවීම් කරනවා. මොකද මේ සැරෙත් කුසලානෙ අපේ ඉස්කෝලෙට ගන්න ඕන. ඔයාට ඉක්මණටම සනීප වෙයි.

තීක්ෂණ :- සර් සුනිමල් අද එයිද? එයා නැත්නම් අපි නාට්‍ය තරඟයට ඉදිරිපත් වෙන්නෙ නෑ.

නිර්මලා :- අනේ ඔව් සර්. මොකද එයා තමයි අපේ නාට්‍යයේ ප්‍රධාන චරිතය අපේ නාට්‍යයේ නමෙත් තියෙන්නෙ ''එයා තමයි වීරයා'' කියලනේ වීරයා ඉන්නම ඕනෙ සර්.

වේදිකාවේ පසුතලය වෙනස් වේ. තරඟය ආරම්භ වේ. එහිදී සුනිමල්ගේ පාසලට ලැබෙන අවස්ථාව උදා වෙනවාත් සමඟම සුනිමල් වේදිකාව පිටුපසින් වේදිකාවේ ඉදිරියට පැමිණේ.)

නාට්‍ය ගුරුවරයා :- සුනිමල් පුතා... ඔයා ආවේ කොහොමද? කා එක්කද ආවේ.

(ඉතා අමාරුවෙන් ඇවිදමින් පැමිණි සුනිමල්, සර්ව දැක සතුටට පත් විය.)

සුනිමල් :- මං ආවා සර්. මට දැන් හොඳටම හොඳයි.

තීක්ෂණ :- සුනිමල් ඔයා ආවද? එහෙනම් අපේ වීරයා ආවා.

(සැවොම ඉතාමත්ව සතුටින් ඉපිළ ගියේය.)

(ටික වේලාවකට පසුව සැවොම නිහඬ වෙමින් බලා සිටිනුයේ ප්‍රතිඵල ලැබෙන තෙක්ය. වේදිකාව පසෙකින් නිවේදක මහතා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමට බලා සිටී.)

වේදිකාව පසුපසින් අත්පොලසන් නාදයක් සමඟ,
''එයා තමයි වීරයා'' සමස්ථ පාසල් නාට්‍ය තරඟයෙන් පළමු ස්ථානය ලබා ගන්නවා...

සුනිමල් :- හුරේ අපි දිනුවා අපි දිනුවා

නාට්‍ය ගුරුවරයා :- ඔයා නිසා තමයි මේ හැම ජයග්‍රහණයක්ම අපේ පාසලට ලැබුනේ. ඔයා තමයි දැන් අපේ වීරයා.

තීක්ෂණ :- අපේ වීරයා සුනිමල්

එකවරම වේදිකාව මතින් විශාල ශබ්දයක් ඇසේ. සියල්ලෝම පුදුමයට පත් වේ. එකවරම සියල්ලම නිහඬ විය. වේදිකාව මත උඩුකුරුව සිහිසුන්ව වැටී සිටි සුනිමල් වට කරගත් ළමයි හඬන්නට විය.

නාට්‍ය ගුරුවරයා :- තීක්ෂණ පුතා අඬන්න එපා. එයා තමයි වීරයා. එයාට දරුණු රෝගයක් තිබුණා. එයා ලොකු ආසාවකින් නාට්‍යයේ රඟපාන්න හිටියේ. මමයි දොස්තර මහත්තයට කියලා එයාට අද එන්න ඉඩ දුන්නේ. එයාගේ අන්තිම දවස අද. එයා හුඟක් සතුටින් අපිව අතහැරලා යන්න ගියේ.

**(මෙම නාට්‍ය පිටපත් ආකෘතිය ආදර්ශයට ගනිමින් දී ඇති සිදුවීම කැමති අවසානයක් කරා රැගෙන යමින් වේදිකාවේ රංගනයට උචිත පරිදි පිටපත රචනා කරන්න. මෙය නාට්‍ය පිටපත් ආකෘතියක් පමණක් බව සලකන්න.)**

***